නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

කුරුණෑගල දිස්ත්‍රික්කය

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 19 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3.5 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහනෙහි, සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර රු.17,794,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.30,832,330 ක් ලෙස රු.13,038,330 ක් වැඩියෙන් ගෙන තිබුණු අතර, ප්‍රාග්ධන වැය රු.28,592,318 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වලට එය රු.21,624,497 ක් ලෙස රු.6,967,821 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.17,328,846 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.40,722,076 ක් ලෙස රු.23,393,230 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි ශේෂය රු.23,599,090 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.33,289,868 ක් ලෙස රු.9,690,778 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයට අදාලව උසාවි දඩ ආදායම රු.7,590,160 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.7,721,088 ක් ලෙස රු.130,928 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු දායක විශ්‍රාම වැටුප් අරමුදල් ශේෂය රු.3,456,151 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.3,364,659 ක් ලෙස රු.91,492 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් වටිනාකම රු.3,758,708 ක් වුවද,මූල්‍ය ප්‍රකාශන වලට එය රු.3,480,963 ක් ලෙස රු.277,745 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(උ). 2012 වර්ෂය වන විට වැඩ නිමකර තිබූ සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් පිරිවැය රු.61,099,770 ක් වුවද, ඉන් රු.20,772,908 ක් පමණක් ප්‍රාග්ධනිත ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගොඩනැගිලි වටිනාකම හා ප්‍රාග්ධන ආදායමට දායකවීමේ ගිණුම් ශේෂය රු.40,326,862 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ). 2010 වර්ෂයේ රු.2,487,516 ක් වැයකර ඉදිකරන ලද පිළිසරු ව්‍යාපෘති ගොඩනැගිල්ලේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(එ). 2009 සහ 2012 වර්ෂ වල පෙර ගෙවුම් ක්‍රමයට ටෙන්ඩර් කල කඩ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයවීමට තිබූ රු.14,582,717 ක මුදල ණයගැතියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඒ). 1992 හා 2008 වර්ෂවල සභාවට ලැබී තිබූ පිරිවැය රු.745,000 ක් වූ අංක 49 -0067 දරන ට්‍රැක්ටරය හා පිරිවැය රු.1,020,000 ක් වූ අංක NW.R.B 0942 දරන ට්‍රැක්ටරය ප්‍රාග්ධනිත ගත කර නොතිබුණි.

(ඔ) 2012 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව සමුච්චිත අරමුදල් ගිණුමේ රු.22,770,888 ක් වූ බැර ශේෂය සමාලෝචිත වර්ෂය ආරම්භයට ලෙජර් ගිණුමට රු.7,388,386 ක හර ශේෂයක් ලෙස ගෙන තිබුණි.

(ඕ) 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමින් ආදායමට දායක වීමේ ගිණුමේ රු.46,726,416 ක් වූ බැර ශේෂය සමාලෝචිත වර්ෂය ආරම්භයට ලෙජර් ගිණුමට රු.74,258,318 ක් ලෙස ගෙන තිබුණි.

### 1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව ලැබීම් හා අවසානයට ශේෂය යටතේ ගිණුම් විෂයයන් 08 කට අදාලව ගිණුම අනුව හා අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 3,514,028 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.3 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති සේවකයන් වෙනුවෙන් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට නියමිත දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,756,151 ක්ව තිබුණි.

### 1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.56,994,826 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණය ඉදිරිපත් නොවුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.46,150,420 ක් වූ අතර, එයින් රු.46,111,246 කට කාල විශ්ලේෂණය ඉදිරිපත් නොවුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 155,304,760 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරික්ෂාවක් කළ නොහැකි විය.

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,170,998 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,171,961 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,342,959 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.32,217,281 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.25,822,686 ක් වූ ප්‍රාග්ධන වියදම් ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.15,565,593 දක්වා වැඩිවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.50,971,567 න් සියයට 66 ක් ලෙස රු.33,796,962 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.32,217,280 න් සියයට 55 ක් ලෙස රු.17,794,000 ක් ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන වියදම වූ රු.41,800,569 න් සියයට 56 ක් ලෙස රු.23,323,459 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වැය වී තිබුණු අතර, ඉන් සියයට 77 ක් ලෙස රු.17,886,251 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.25,822,686 න් සියයට 42 ක් ලෙස රු.10,793,318 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබුණු අතර, ඉතිරි සියයට 58 ක් වූ රු.15,029,368 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම්ද ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් බදු

නිකවැරටිය සමූපකාර සමිතියට අයත් වාර්ෂිකව රු.51,356 ක් පමණ බිල්කරන දේපල 30 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු.51,356 ක හිඟයක්ද, සභා බල ප්‍රදේශයේ පවතින වී අලෙවි මණ්ඩලයට අයත් වාර්ෂිකව රු.28,608 ක් පමණ බිල්කරන දේපල 9 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.169,958 ක හිඟයක්ද පැවතුණි.

2.3.3 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 152(1) වගන්ති ප්‍රකාරව, කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණද, සභාව විසින් පනවන ලද බද්ද දින 7 ක් ඇතුලත ගෙවන ලෙස ප්‍රා.ස. 26 ආකෘතිය අනුව අදාල පාර්ශවයන්ට දැනුම් දී නොතිබුණි.

2.3.4 කඩකාමර බදු

(අ). බස්නැවතුම්පල පහත මාලයේ කඩ කාමර 18 ක් හා උඩුමහලේ කඩ කාමර 12 ක් පෙර ගෙවුම් ක්‍රමයට 2009 ජූලි මාසයේදී ටෙන්ඩර් කර තිබුණි. අවම ලංසු එකතුව රු.4,200,000 ක් වූ උඩුමහලේ කඩ කාමර 12 ක් හා අවම ලංසුව රු.711,000 ක් වූ බිම් මහලේ අංක 05 දරන කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් වී නොතිබුණි. කඩ කාමර ටෙන්ඩර් කිරීමට අදාල ටෙන්ඩර් කොන්දේසි අනුව පිළිගත් ටෙන්ඩර් මුදලින් සියයට 40 ක් අදාල ලිපිය ලැබී දින 21 ක් ඇතුලත ගෙවිය යුතු වූ අතර, ඉතිරි සියයට 60 ක මුදල මාස 5 ක් ඇතුලත ගෙවා අවසන් කළයුතු විය. එහෙත් බිම් මහලේ කඩ කාමර 17 න් කඩ කාමර 4 ක එකතු ටෙන්ඩර් මුදල වූ රු.2,635,100 ක මුළු ප්‍රමාණයමද, කඩ කාමර 11 ක එකතු ටෙන්ඩර් මුදල වූ රු.5,784,500 න් රු.2,221,298 ක්ද 2013 දෙසැම්බර් වන විට හිඟව පැවතුණි. නැවත 2012 ජූලි මාසයේදී උඩු මහලේ කඩ කාමර 12 ක් බදුදීම සඳහා ටෙන්ඩර් කර තිබූ අතර, අදාල ටෙන්ඩර් කොන්දේසි අනුව පිළිගත් ටෙන්ඩර් මුදලින් සියයට 50 ක් අදාල ලිපිය ලැබී දින 21 ක් ඇතුලත හා ඉතිරි සියයට 50 දින 90 ක් ඇතුලතද එකවර හෝ කොටස් වශයෙන් ගෙවිය යුතු විය. එහෙත් රු.820,500 කට ටෙන්ඩර් වූ අංක A 1-1 දරන කඩයෙන් කිසිදු මුදලක් අයවී නොතිබුණ අතර, තවත් කඩ කාමර 8 ක එකතු ටෙන්ඩර් මුදල වූ රු.4,341,000 න් රු.2,420,760 ක් 2013 දෙසැම්බර් වන විටත් අයවී නොතිබුණි.

(ආ). සායන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ උඩුමහලේ සහ බිම් මහලේ කඩ කාමර 22 ක් 2012 සැප්තැම්බර් මස අවම ලංසු එකතුව රු.24,340,000 කට එකවර ගෙවන මුදල් ලබාගැනීමේ ක්‍රමයකට ටෙන්ඩර් කර තිබුණි. මින් අවම ලංසුව එකතුව රු. 3,990,000 ක් වූ කඩ කාමර 5 ක් පමණක් රු.4,013,500 කට ටෙන්ඩර් වී තිබුණද, 2013 නොවැම්බර් මාසය දක්වාම කිසිදු මුදලක් අයවී නොතිබුණි. නැවත වතාවක් 2013 මැයි මාසයේදී අවම ලංසුව එකතුව රු.15,750,000 කට බිම් මහලේ කඩ කාමර 21 ක්ද අවම ලංසුව එකතුව රු.3,600,000 කට උඩුමහලේ කඩ කාමර 4 ක්ද ටෙන්ඩර් කර තිබූ අතර, මින් අවම ලංසුව එකතුව රු.6,970,000 ක් වූ කඩ කාමර 9 ක් රු.7,045,000 කට ටෙන්ඩර් වී තිබුණි. එහෙත් රු.750,500 කට ටෙන්ඩර් වී තිබූ බිම් මහලේ අංක 10 දරන කඩ කාමරයෙන් කිසිදු මුදලක් අයවී නොතිබූ අතර, තවත් කඩ කාමර 8 කින් රු.4,048,750 ක මුදලක් 2013 දෙසැම්බර් වන විටද හිඟව පැවතුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

සභාව විසින් සභාවට අයත් දේපල හඳුනාගෙන ඒවායේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමකින් තොරව භාහිර පාර්ශවයන්ට ඒවායෙහි ගොඩනැගිලි ඉදිකිරීමට අවසර ලබාදී තිබුණු අවස්ථා විය. සභාවට අයත් පළුගස් හන්දිය පිඹුරු අංක සී.59 ඉඩම් කොටසේ 2009 වර්ෂයේදී බාහිර පාර්ශවයක් විසින් රුපියල් මිලියනයක් වැය කර අනවසරයෙන් කිරිහලක් හා නිෂ්පාදනාගාරයක් ඉදිකර තිබුණි. සභාව විසින් එම ස්ථානයට විදුලි හා ජල පහසුකම් ලබාගැනීමට අවසර ලබාදී තිබුණි.

3.2 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2011 වර්ෂයේදී රු.15,321,032 ක පිරිවැයට වැඩ අවසන් කර තිබූ කඩ කාමර සංඛ්‍යාව 30 කින් සමන්විත බස්නැවතුම්පල ගොඩනැගිල්ලට 2013 දෙසැම්බර් මස වන විටත් ජලය හා විදුලිය සැපයුම් ලබාදී ව්‍යාපාරික කටයුතු සඳහා විවෘත කර නොතිබුණි.

(ආ). ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ 2011 දෙසැම්බර් මස වන විට රු.61,099,770 කට වැඩ අවසන් කර තිබූ සායන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට 2013 දෙසැම්බර් දක්වාම ජලය හා විදුලිය ලබාගෙන විවෘත කර නොතිබුණි. එහෙත් මෙම මධ්‍යස්ථානය ඉදිකිරීමට ලබාගත් ණය වෙනුවෙන් වාරික හා පොලී වෙනුවෙන් 2012 වර්ෂයේදී රු.3,798,750 ක්ද, 2013 වර්ෂයට අදාල රු.3,164,584 ක්ද ගෙවීමට සිදුව තිබුණි. විදුලිය ලබාගැනීම සඳහා රු.2,500,000 ක් ඇස්තමේන්තු කර තිබුණද ඊට අදාල ප්‍රතිපාදන නොවූ අතර ගොඩනැගිල්ලෙහි විදුලි පද්ධතිය සැකසීමේදී එක් එක් කඩ කාමරය සඳහා වෙන වෙනම විදුලි මීටර් සවිකල හැකි වන අයුරින් විදුලිය සැසදීම් කර නොතිබුණි.

3.3 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

රු. 3,449,380 ක් වැය කර ඉදිකර තිබුණු පිළිසරු ව්‍යාපෘති කටයුතු 2012 වර්ෂය වන විට නිමකර තිබුණද විදුලිය හා ජලය ලබාගැනීමේ ප්‍රමාදය හේතුවෙන් අදාල ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි. දැනට සභා බල ප්‍රදේශයේ එකතුවන කසල තිඹිරියාව පිහිටි අක්කර 10 ක පමණ බිම් ප්‍රමාණයක වළ ක්‍රමයට බැහැර කිරීම සිදුකර තිබුණි.

04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම